මධ්‍යම පළාත් සහා රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ

ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනය - 01

| ඡේද අංකය | දැනට තිබෙන පිළිවෙල | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනය කිරීමට හේතුව |
|---|---|---|---|---|
| 7.6 | බඳවා ගැනීමේ ක්‍රමය<br><br>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ. | 7.6 | බඳවා ගැනීමේ ක්‍රමය<br><br>ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේදී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගන්නා ලකුණු ප්‍රමුඛතාවය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.<br><br>ලිඛිත පරීක්ෂණයට ලකුණු 100<br>සම්මුඛ පරීක්ෂණයට ලකුණු 100 | පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් ලබා සිටින තත්ත්වයකදී වඩා සුදුසුම නිලධාරීන් තෝරා ගැනීම සඳහා. (පළමු වතාවේ හැර) |
| 7.6.1 | ලිඛිත විභාගය<br>අදාළ නොවේ | 7.6.1 | ලිඛිත පරීක්ෂණය<br>ඇමුණුම 01 | පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් ලබා සිටින විට. |
| 7.6.4 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය<br><br>ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 01 හි ඇතුළත් වේ. | 7.6.4 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය<br><br>ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 02 හි ඇතුළත් වේ. | |
| 13<br><br><br><br><br><br><br>I | අන්තර්කාලීන විධිවිධාන<br><br>පහත සඳහන් අන්තර්කාලීන විධිවිධාන මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාළ වන පරිදි ක්‍රියාත්මක වේ.<br><br>මධ්‍යම පළාතේ පරිවාස නිලධාරී තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ හා සක්‍රිය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ | 13.<br><br>13.1<br><br><br><br><br>13.2 | අන්තර්කාලීන විධිවිධාන<br><br>මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාළ වන පරිදි ක්‍රියාත්මක වේ.<br><br>පරිවාස නිලධාරී තනතුරේ වසර 15 ක් සපුරා ඇති හා පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ හා සක්‍රිය I ශ්‍රේණියේ සේවා කාලයක් ඇති, එම වසර 05 තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති, I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම නියමිත පරිදි සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරෙහි පවතින | පරිපාටිය ක්‍රියාත්මක දිනට පුරප්පාඩුවලට සරිලන සුදුසුකම් ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් |

2018-01-03

ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. | | පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරනු ලැබේ. | |
| II | මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට නිලධාරීන් පත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත. | 13.3 | මෙම පරිපාටිය ප්‍රකාශයට පත් කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට නිලධාරීන් පත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත. | |
| III | කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය. | 13.4 | කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛන හෝ විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය. | |

ඇමුණුම - 01

01. ලිඛිත පරීක්ෂණයේ නම :- මධ්‍යම පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය.

02. ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාවය | පැය 01 | 100 | 50% |
| 2.විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 50% |
| 3.පොදු පරීක්ෂණය | පැය 01 | 100 | 50% |

03.ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :- මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04.ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :- ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුරේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018-01-03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

05.ලිඛිත පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අභියෝගයතාවය | තමා වෙත පැවරෙන කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්ම වූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා වන දැනුම, කුසලතා, හා ආකල්ප අත්පත් කරගෙන තිබේද? යන්න හා ඒවා භාවිතයේ දී ඉහළ ප්‍රවීණතාවයක් දක්වන්නේද? යන්න මැන බැලීමේ අභියෝගයතා පරීක්ෂණයකි.<br>අපේක්ෂකයින්ගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව හා විශ්ලේෂණාත්මක හැකියාව, සංඛ්‍යානමය හැකියාව, තර්කන හැකියාව, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| 2.විෂයානුබද්ධ දැනුම | පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පථයට අදාළ නීති, අණ පනත් හා නියෝග කාලීන වශයෙන් වෙනස් විය යුතු නම් හේතු සාධක ඇතිව විකල්ප ක්‍රම හඳුනා ගැනීම ආදී කරුණු සම්බන්ධයෙන් සිද්ධිමය කරුණු ඇතුළත්ව සැකසෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 3.පොදු පරීක්ෂණය | කාලීන, සමාජයීය සිදුවීම් පිළිබඳව අවබෝධ කරගෙන විග්‍රහ කර ගැනීමේ හැකියාව මැන බැලීමේ ප්‍රශ්න පත්‍රයකි. |

ඇමුණුම 02

ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම : ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර :

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය<br>පරිවාස නිලධාරි I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 60 | 60 | ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ. |
| 3. වෘත්තීය /ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම.<br>(සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, උපදේශනය, ළමා රැකවරණය, නීතිය, අපරාධ විද්‍යාව, සාමය හා ගැටුම් කළමනාකරණය, මානව විද්‍යාව / උපදේශනය විෂයයන්ට අදාළව)<br><br>1. සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ( ක්ෂේත්‍රයට අදාලව)<br>• වසරට නොඅඩු ලකුණු 03<br>• මාස 6 ට නොඅඩු ලකුණු 02<br>• මාස 03 ක් හෝ 03ට නොඅඩු ලකුණු 01<br><br>2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවක් සඳහා (දැ අවුරුදු) උපරිම ලකුණු 06 | 17 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2018-01-03 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | |
|---|---|---|
| 3. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධියක් සඳහා<br>• පර්යේෂණ නිබන්ධනය සහිතව ලකුණු 08<br>• පර්යේෂණ නිබන්ධනය රහිතව ලකුණු 06 | | |
| 4. නිර්මාණාත්මක වැඩසටහන් සඳහා<br>1. වරදකරුවන් පුනරුත්ථාපනය හා විශෝධනය පිණිස විෂය සමගාමීව සේවාවේ අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා ස්වයං නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීම. (එක් වැඩසටහනකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 06)<br>2. ළමාරක්ෂණය හා ළමා සංවර්ධනයට අදාළව විෂය සමගාමීව ආයතනික හෝ ආයතනික නොවන ළමුන් සඳහා සේවාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඵලදායී ස්වයං නිර්මාණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(එක් වැඩසටහනකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 06)<br>3. වෙනත්<br>3.1. පරිවාස හා ළමාරක්ෂක සේවාවට අදාළ නීතිමය තත්ත්වයන් පිළිබඳව අධ්‍යයනය, ප්‍රචාරණය හා ප්‍රවර්ධනයට අදාළ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්.<br>3.2. විෂය ක්ෂේත්‍රයට අදාළව වැඩසටහන් හෝ වෙනත් අවස්ථාවන් සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ උපායමාර්ග / වැඩසටහන් සඳහා පොත්පත්, සඟරා, අත්පත්‍රිකා, පෝස්ටර්, විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් නිර්මාණ කර තිබීම.<br>3.3. සේවා ප්‍රවර්ධනය අරමුණින් අභ්‍යන්තර හෝ බාහිර ආයතන සඳහා මානව හා භෞතික සම්පත් කළමනාකරණය හා ප්‍රවර්ධනය සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් කිරීම.<br>3.4. අන්තර් ආයතන හා බාහිර පුද්ගල සහාය තුළින් තම රාජකාරි බල ප්‍රදේශය තුළ සේවා ප්‍රවර්ධනයට අදාළව සිදු කළ නිර්මාණාත්මක වැඩසටහන්<br>3.5. බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය සැපයීම (රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන සඳහා)<br>(එක් කොටසකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 05)<br>❖ එක් අංශයකින් අවම වැඩසටහන් හෝ නිර්මාණ 02 ක්වත් සිදු කර තිබීම සලකා බැලීම අවශ්‍ය වේ.<br>❖ එක් එක් නිර්මාණාත්මක වැඩසටහන්, තමා විසින්ම සිදු කර ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා තහවුරු කළ යුතුය. | 17 | |
| 5. ස්ථානභාර පරිවාස නිලධාරියෙකු ලෙස සේවය කළ වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 06 යි | 06 | |
| එකතුව | 100 | |

03. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්හිදී පවත්වනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2018-01-03 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ..........................................

02. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය (සාමාජික) ..........................................

03. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ..........................................

04. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා (සාමාජික) ..........................................

05. ඩබ්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..........................................

දිනය:- 2017.10.31

ආණ්ඩුකාර ලේකම්,

2017.10.31 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 17/1432 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනය - 01, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2017.10.31

..........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව
ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය.

දිනය ..............................

අනුමත කරමි / ~~නොකරමි~~

..........................................
නිලුකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
~~2017/01/~~
2018.01.03